# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1953/24 - 2016 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යවරයාට පැවරෙන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2016 පෙබරවාරි මස 15 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

| *1 වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *2 වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *3 වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආර්ථික හා කාර්මික කලාපයන්ට අදල ගැටළු හා කාර්ය සාධනය පිළිබඳ අධීක්ෂණය හා පසු විපරම් කිරීම. | 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 1. මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය.<br>(ආයෝජන මණ්ඩල නීතිය)<br>1978 අංක 04 |
| 2. ආයෝජකයින් මුහුණ පාන ගැටළු හා බාධාවන් හඳුනාගෙන 2 වැනි තීරුවේ දක්වෙන අදල ආයතනවලට යොමු කිරීම හා පසුවිපරම් කිරීම. | 2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත<br>1979 අංක 04 |
| 3. අපනයන ක්ෂෙත්‍රයට අදල අපනයනකරුවන් මුහුණ පාන ගැටළු හඳුනාගෙන ඒවා 2 වැනි තීරුවේ අදල ආයතනවලට යොමුකිරීම හා අධීක්ෂණය. | | |


1A - G 23010— 361 (2016/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *1 වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *2 වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *3 වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 4. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සමස්ත පසුවිපරම් කිරීම. | | |
| 5. ආර්ථික සංවර්ධන කලාපවලට අයත් වෘත්තීය සමිති සහ සේවක ගැටළු විසඳීම සඳහා උපදේශනය හා නායකත්වය සැපයීම. | | |

02-748

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.